# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2013.03.27 |
| **වේලාව** | : | පෙ.ව. 10.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

- ගරු නාගරික මන්ත්‍රී, චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා හට දරුවාගේ අසනීප තත්ත්වය හේතුවෙන් මෙදින මහා සභා රැස්වීමට පැමිණීමට නොහැකි බැවින් නිවාඩු ලබා දෙන මෙන් ඉල්ලා ලිපියක් එවා තිබූ අතර, එම නිවාඩු අනුමත කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**නිලධාරී සහභාගීත්වය**

1. ප්‍රධාන කළමනාකරණ සහකාර එස්. එච්. අමිතා කරුණාරත්න මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව වෙනත් අදහස් දැක්වීම් නොවූ බැවින් එය කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ මාර්තු මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සමාලෝචනය සිදු කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා මාර්ග නඩත්තු වාර්තාව හා ආයුර්වේදයේ කටයුතු වලට අදාල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.ඉදිරිපත් කරන ලදී.

### 05:01 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව අමතමින්, ආයුර්වේද වෛද්‍ය නිලධාරී චන්ද්‍රා රණසිංහ මහත්මිය ඉතාමත් අලංකාර සහ විධිමත් අන්දමින් ඔසු උයනක් සහ ආයුර්වේද බෙහෙත් ශාලාව පවත්වාගෙන යන බව සඳහන් කරන ලද අතර, ඒ සඳහා ඇයට සභාව විසින් ප්‍රශංසා කළ යුතු බවට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් හා යෝජනා ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ඇල්ලඅරාව නිකලන්ද මාවතේ පිහිටි විදුලිය රැහැන් අදින ලද කණුවක් අසළ මාර්ගය බිඳී යාම

ඇල්ලෙඅරාව නිකලන්ද මාවතේ පිහිටි විදුලිය රැහැන් අදින ලද කණුවක් අසළ මාර්ගය බිඳී යාම සම්බන්ධව මෙම සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, සභා නිලධාරීන් විසින් ස්ථානය පරීක්ෂා කර එම මාර්ගයට පැති බැම්මක් ඉදිකිරීම සඳහා රු. 59,724.37ක මුදලක් ඇස්තමේන්තු කර ඇති බැවින් මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන පරිදි එම කාර්යය ඉටු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් හෝ යෝජනා ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය

### 06:02 තුඹගොඩ චෙට්නෝල් මාර්ගයේ බෝක්කුවක් අබලන් වීම සම්බන්ධව

තුඹගොඩ චෙට්නෝල් මාර්ගයේ රාජු මුණසිංහ මහතාගේ නිවස අසල ප්‍රධාන පාර හරහා වැසි දිනයන්හි ජලය ගලා ඒමෙන් මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බවට මෙම සභාවට ධම්මානන්ද ප්‍රජා සුභසාධක සමිතිය විසින් වාර්තා කර ඇති බව දක්වමින් අදාල මාර්ගය මුදල් ප්‍රතිපාදන ලැබෙන පරිදි අලුත්වැඩියා කිරීමට ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 දොරවෙල ඔය ඉවුරු සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය - අත්තිකාරම් මුදල් ලබා දීම

ඉහත ව්‍යාපෘතියේ පළමු වාරිකය එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස සංවර්ධන වැඩසටහන (UN Habitat) වෙතින් ලැබී ඇති අතර, එහි දෙවන වාරිකය ගෙන්වා ගැනීම සඳහා එම ලැබුණු මුල් වාරිකයෙන් 80%ක මුදලක් වියදම්කර තිබිය යුතුවේ. නමුත් ගිවිසුම්

ප්‍රකාරව 20%ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දීමෙන් වියදම් කළ හැකි වන්නේ මුලින් ලැබූ මුදලින් 78%ක් පමණ වේ. එබැවින් ඉතිරි මුදල වියදම් කර පෙන්වීම අවශ්‍ය වන බැවින් කොන්ත්‍රාත්කරු වෙත 25%ක අත්තිකාරම් මුදලක් ලබා දීම සිදු කළහොත් දෙවන වාරිකය ඉල්ලීම් කිරීමට හැකිවන බවත්, 25%ක අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 බේරුම්කරණය සම්බන්ධයෙන් යොමු වී තිබූ වැසිජල අපවහන කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා ලබා දුන් ණය මුදල සම්බන්ධවයි**

බලන්ගොඩ නගරයේ වැසිජල අපවහන කාණු පද්ධතිය ඉදිකිරීමට අදාල ණය මුදල පියවීම සම්බන්ධයෙන් දේශිය ණය සහ සංවර්ධන අරමුදල සහ මෙම සභාව අතර පැවති බේරුම්කරණ විභාගයේ තීන්දුවට අනුව අදාල ණය මුදල ගෙවීම සඳහා වන ක්‍රියා පිළිවෙල දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙතින් ලැබී ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලදී. එමෙන්ම මේ සම්බන්ධව මෙවර මුදල් කමිටුවේ දී සිදුකරන ලද සාකච්ඡාවේ දී මෙම සභාවේ ලේකම් සහ ගණකාධිකාරී විසින් එම මුදල බේරුම්කරණ තීන්දුවට අනුව ගෙවීම කළ යුතු බව පෙන්වා දුන් අතර, 2013 පෙබරවාරි මස මහා සභා වාරයේ දී යෝජනා අංක 06:06 අනුව අදාල තීන්දුව සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින්, එම අභියාචනාධිකරණ තීන්දුව ලැබීමෙන් පසු ගෙවීම් කටයුතු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටි. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:05 3089 නඩුවේ විරෝධතා සකස් කිරීම වෙනුවෙන් නීතිඥ ඩබ්. දයාරත්න මහතාට ගෙවීම**

බලන්ගොඩ මහජන පොල ඉඩමට අදාල 3089 නීති කෘත්‍යයට අදාල විරෝධතා සකස් කිරීම සඳහා වන ගාස්තුව වශයෙන් ඩබ්. දයාරත්න මහතා විසින් ඉල්ලා ඇති රු. 40,000.00ක මුදල ගෙවීම සඳහා ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:06 වරිපනම් අය කිරීම අත්හිටුවීම - අංක 88, හපුතල පාර, බලන්ගොඩ**

බලන්ගොඩ, හපුතල පාර, අංක 88 යන ස්ථානයේ පිහිටි කඩකාමරයේ ව්‍යාපාර කටයුතු නවතා 2013 ජනවාරි මාසයේ සිට අළුත්වැඩියා කටයුතු කරනු ලබන හෙයින් නැවත ව්‍යාපාරය ආරම්භ කරන තෙක් වරිපනම් සඳහා සහනයක් ලබා දෙන මෙන් ඩී. වී. නිව්ටන් යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා වරිපනම් සම්පූර්ණයෙන් නිදහස් කර ඉඩම සඳහා පමණක් අය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරුද්ධව අදහස් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 බස් නැවතුම්පොල සී - 57දරන කඩ කාමරය නැවත සභාවට භාර දීම**

නව බස් නැවතුම්පොලේ සවිකර තිබූ විදුලි ජනක යන්ත්‍රය ප්‍රයෝජනයට නොගන්නා බැවින් තානායම් භූමියේ සවි කරන ලද අතර, එම විදුලි ජනක යන්ත්‍රය බස් නැවතුම්පොලේ සවිකර තිබූ ඉඩ ප්‍රමාණය බදු පදනම මත ලබා දුන් අතර, එසේ ලබා ගත් තැනැත්තා විසින් කුලී ගෙවීමට නොහැකි බැවින් එය වෙනත් අයකුට පවරා දෙන මෙන්

ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලදී. එම ස්ථානය වෙනත් පුද්ගලයකු විසින් ඉල්ලා ඇති බැවින්, සභා තීරණයක් මත මාස 06ක ඇප තැන්පත් ගෙන බදු පදනම මත ලබා දීමට ද එතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 'අරුණළු' මාසික සඟරාව**

බලන්ගොඩ නගර සභාවේ සංවර්ධන පුවත් එකතුව වන 'අරුණළු' සඟරාවේ 2013 මාර්තු මස කළාපය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී,

**06:09 විදේශගත වීම සඳහා නිවාඩු අනුමත කර ගැනීම**

2013.04.14 වන දින සිට 2013.05.05 වන දින දක්වා පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා විදේශ ගත වීමට නිවාඩු අනුමත කරදෙන මෙන් ගරු උපසභාපතිතුමන් විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම්දුන් අතර, අදාල නිවාඩුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව එහි අනුමත වී ඇත.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 මහජන පොල අතිරේක මඩු ඉදිකිරීම**

2013.02.18 වන දින පැවති මුදල් කමිටු තීරණය අනුව වැඩ අධිකාරී විසින් මහජන පොල අතිරේක මඩු සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු ප්‍රකාරව එහි වියදම රු. 1,000,000.00ක් බවට ඇස්තමේන්තු කර ඇත. ගරු සභාපතිතුමා වෙත හා ගරු මන්ත්‍රීතුමන්ලාට වෙන් කරන ලද මුදලින් ඒ සඳහා රු. ලක්ෂ 06ක මුදලක් දැරිය හැකි අතර, ඉතිරි 400,000.00ක් වූ මුදල දැනට සභාව වෙත ලැබී ඇති මුද්දර ගාස්තු වලින් කොටසක් යොදවා ඉදිකිරීමට කටයුතු කරන මෙන් තමන් විසින් උපදෙස් දී ඇති අතර මෙය මුදල් උපයන ව්‍යාපෘතියක් බැවින් අදාල මුදල සභාව වෙත සතිපතා අයවීම සලකා පොදු මහජන උපයෝගී ක්‍රියාවලියක් සම්පූර්ණ කිරීමේ පරමාර්ථ ඉටු කිරීමක් වන බැවින් රු. 1,000,000.00ක වන මූල්‍ය ඇස්තමේන්තුවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ද, මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතියට ලබා දීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

**09:01 පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම කැඳවීම - 2013.03.15**

පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය සඳහා දෙවන වරටත් 2013.03.15 වන දින පෙ.ව. 10.30ට පමණ ලංසු පත් විවෘත කිරීමට නියමිතව තිබූ අතර, අදාල කඩ කාමරය සඳහා මෙවර ද ලංසු කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. එදින රැස්වූ ටෙන්ඩර් කමිටුව මේ පිළිබඳව මහා සභාවට යොමු කිරීමට තීරණය කරන ලදී. මෙම තත්ත්වය පිළිබඳව පළාත් පාලන

කොමසාරිස් දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11:01 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

1. පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නගරයට අලංකාරයක් වන අන්දමින් ඉදි කිරීම

දැනට නගර සභා නිලධාරීන් සඳහා වන නිල නිවාස 3ක් පිහිටුවා ඇති බළන්ගොඩ පරණ පාරේ පිහිටි පැරණි පුස්තකාල ගොඩනැගිල්ල අලංකාර අන්දමින් නවීකරණය කර එහි කොටසක් කියවීම් ශාලාවක් සඳහා සහ ඉතිරි කොටස පොදු වැසිකිළි/කැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් සභාවට දන්වා ඇති අතර, දැනට එම නිලනිවාසයන් සඳහා වෙනත් සුදුසු ස්ථානයක් ලබා දීමෙන් අනතුරුව අදාල යෝජනාව ක්‍රියාත්මක කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

1. දැනට මන්ත්‍රීවරුන් සඳහා ලැබෙන රු. 3,000.00 ඉන්ධන දීමනාව රු. 5,000.00 දක්වා වැඩි කිරීම

දැනට නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබෙන රු. 3,000.00ක ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන බැවින්, එය රු. 5,000.00 දක්වා ඉහල නැංවීමට ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් යෝජනා කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර අදහස් දැක්වීම් වලින් පසු එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

2. නගරයේ ක්‍රීඩා දියුණු කිරීම

නගර සභා සීමාව තුළ ජීවත් වන තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞශල්‍යය දියුණු කිරීම සඳහා ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රීඩා උපදේශන කමිටුවක් පත් කිරීමට ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මල්ක් ෂා මැතිතුමන් විසින් යෝජනා කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම යෝජනාව අනුව ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සම්බන්ධව ඉදිරි කාලයේ දී සලකා බැලීමට කටයුතු කළ යුතු බවට තීරණය විය.

### 11:03 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා

1. ඉරිදා පොල හා සතිපොලට පැමිණෙන ජනතාවට බීමට ජලය ලබා ගැනීමට ජල කරාමයක් සවි කිරීම.
2. බළන්ගොඩ බස් නැවතුම්පොලේ පිහිටීම පිළිබඳ සැලැස්මක් බස්නැවතුම්පොල ඉදිරිපිට සවි කිරීම.
3. දිවංගත ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා නමින් නම් කරන ලද නව අතුරු මාර්ගයේ නම සඳහන් දැන්වීම් පුවරුව සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම.

4. මාසික කුලී පදනම යටතේ වාර්ෂිකව බදු දෙන කඩ කාමර සඳහා දීර්ඝ කාලීන බදු ගිවිසුමකට එළැඹීම.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර, එම යෝජනාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.
එය ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 මාර්තු ලැබීම් විග්‍රහය

- 2013 මාර්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත **විය.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 3,958,762.57 |
| වෙනත් ලැබීම් | 1,017,212.87 |
| **මුළු ලැබීම්** | **4,975,975.44** |

- බලන්ගොඩ තානායමේ 2013.02..01 සිට 2013.02.28 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 2013.02.01 සිට 2013:02.28 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2013.02.01 සිට 2013:02.28 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 264,800.71කි

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 පුස්තකාල උපදේශන කමිටු රැස්වීම් වාර්තාව

2013.13.07 වන දිනැති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරමින්, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:02 මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව

2013.03.20 වන දිනැති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:03 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාව**

2013.03.20 වන දිනැති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:04 කර්මාන්ත හා සංවර්ධන කමිටු වාර්තාව**

2013.03.20 වන දිනැති කර්මාන්ත හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 16. වෙනත් කරුණු:

**16:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා සභාව අමතමින්, බළන්ගොඩ නගර සභාවට ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ කීර්තියක් ලබා දීමට කටයුතු කරන මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතාගේ ස්ථාන මාරුව කල් දැමීමට කටයුතු කිරීම සම්බන්ධව සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත ස්තුතිය පළ කරන බව සඳහන් කළේය.

එමෙන්ම බළන්ගොඩ ජෙයිලානි මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශයක් අල් මිනාරා ප්‍රාථමික විද්‍යාලය නමින් ආරම්භ කිරීමට කටයුතු කරන ලද සබරගමුව පළාත් අධ්‍යාපන ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමන් වෙත ද බළන්ගොඩ අල්මිනාරා විද්‍යාලයේ විදුහල්පතිතුමන්, ගුරුවරුන්, දෙමාපියන් සහ සිසුන් ඇතුළු බළන්ගොඩ මුස්ලිම් ජනතාව වෙනුවෙන් ස්තුතිය පළ කරන බව දක්වන ලදී.

බළන්ගොඩ නගර සභාවට හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ට අයිති දෙහිගස්තලාව මාර්ගය බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් විසින් සබරගමුව පළාත් මාර්ග ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් වෙත දැනුම් දීමෙන් අනතුරුව අදාල සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කටයුතු කිරීම සම්බන්ධව ස්තුතිය පළ කරන ලදී.

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට එක්සත් ජාතික පක්ෂයෙන් පත්වී ඇති මුස්ලිම් මන්ත්‍රීවරයා නිතර කොළඹ ප්‍රදේශයේ සිටින බැවින් එම ප්‍රදේශයට අදාල ඉල්ලීම් ද නගර සභා මන්ත්‍රීවරයකු වශයෙන් තමන්ට ඉදිරිපත් කිරීමට සිදුව ඇති බව ද දක්වන ලදී.

**16:02 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

නගර සභා බල ප්‍රදේශයේ විදුලි පහන් සම්බන්ධ අලුත්වැඩියා කටයුතු සඳහා පළාත් සභා ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමන් විසින් රු. 2,000,000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇති බව ද, ඒ සම්බන්ධයෙන් එතුමාට සභාවේ ස්තුතිය පළ කරන බව ද, මෙම මුදල් ප්‍රතිපාදන ක්‍රමය දැන් අභිනවයෙන් ක්‍රියාත්මක වන පනත පරිදි කොට්ඨාස ක්‍රමය යටතේ මන්ත්‍රීතුමන්ලා වෙත වෙන් කිරීම සුදුසු බව ද සඳහන් කළේය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී අසංක විජයසිංහ මැතිතුමන්ගේ නිවස ඉදිරිපිට යම් පුද්ගලයන් විසින් සිදු කරන ලද ගොඩකිරීම් හේතුවෙන් ජලය බැසයාම පිළිබඳ ප්‍රශ්න

ඇතිවන බව ද, තමන් දන්නා පරිදි මේවා නිසි පරිදි අනුමැතියට අනුව සිදු නොවන බව ද ප්‍රකාශ කළේය. මේවා සම්බන්ධව තීරණ ක්‍රියාත්මක කිරීමේ දී එම ස්ථානයේ දිගටම නිලධාරීන් යොදවා තැබීම ද සිදු නොකළ බැවින් ඒ සම්බන්ධව සොයා බලා කටයුතු කළ යුතු බව සඳහන් කළේය.

පසුගිය දිනක ශ්‍රී ලාංකික ස්වාමීන් වහන්සේ නමකට ඉන්දියාවේ දී පහර දීමක් සිදු කර ඇති බැවින් ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ට අවදානම් තත්ත්වයක් ඇතිව තිබෙනවා. මෙය ස්වාමීන් වහන්සේ නමකට සිදු වුවත්, සිංහල, දෙමළ, මුස්ලිම්, කවර හෝ ශ්‍රී ලාංකිකයකුට සිදු වුවත් ඒ සම්බන්ධව පිළිකුල් සහගතව දැඩි විරෝධය හා කණගාටුව ප්‍රකාශ කළ යුතුයි.

ලාංකික වන්දනාකරුවන් ඉන්දියාවේ සංචාරයන් සිදු කරන්නේ බුදු රජාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය හා පරිනිර්වාණය සිදුව ඇත්තේ ඉන්දියාවේ බව සිතාගෙන වුවත් තමා දන්නා පරිද්දෙන් ඉන්දියානු ඉතිහාසයේ එවන් දෙයක් සඳහන් නොවන බව ද, බලන්ගොඩ ප්‍රදේශයේ බුදුගල විහාරස්ථානයට ආසන්න තැනක දී බුදු රජාණන් වහනසේගේ පරිනිර්වාණය සිදුවූ ස්ථානය බවට තොරතුරු ලැබී ඇති බව ද සඳහන් කළේය. ඉන්දියානුවන් විසින් ශ්‍රී ලංකාවේ සිදුවූ සියළු විශේෂ සිද්ධීන්ට අදාලව එහි ආකෘතීන් සැදීමට  කටයුතු කර ඇති බව ද  සඳහන් කළේය.

එමෙන්ම කෙටි නිවාඩුවටක තායිලන්තයට ගොස් ශාසනික කටයුත්තකට සහභාගී වීමට අදහස් කරන බව ද, මීළඟ මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව බැවින් සියලුම දෙනාට සුභ අලුත් අවුරුද්දක වේවා යැයි ප්‍රාර්ථනා කරන බව ද සඳහන් කළේය.

**16:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් සභාව අමතමින්, පසුගිය දිනවල ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රශ්නයක් වශයෙන් කතාබහට ලක් වූ හලාල් සම්බන්ද ගැටළුව විසඳුනු බව සඳහන් කළේය. නමුත් මුස්ලිම් ජනතාව හලාල් වෙනස් නොකරන බව ද, මුස්ලිම් ජනාතාව විසින් හලාල් සහතිකය ඉල්ලා නොසිටි බව ද, ලාංඡනය තිබුණේ වුව නැත්තේ වුව ඔවුන් හලාල් හඳුනාගෙන භාවිත කරන බව ද සඳහන් කරන ලදී. බොදු බල සේනා සංවිධානය මුස්ලිම් ජනතාවට විරුද්ධ වන්නේ කවර කාරණයක් හේතුවෙන් දැයි කණගාටුවට පත් වන බව ද සඳහන් කළේය. මුස්ලිම් ජනතාව රටෙන් කොටසක් නොඉල්ලූ බව ද, ඔවුන් මෙරටට පැමිණියේ වෙළඳ කටයුතු සඳහා බව ද, කොටි ත්‍රස්තවාදීන් සමඟ යුද්ධය පැවති කාලයේ දී රටට විශ්වසනීයව හා ආදරයෙන් කටයුතු කළ බව ද සඳහන් කළේය.

එමෙන්ම ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සියළුම මුස්ලිම් රටවල් පාහේ ආධාර ලබා දෙන බව ද, ශ්‍රී ලංකාවට එරෙහිව ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරයේ දී ඇමරිකාව විසින් ගෙන එන ලද යෝජනාවට මුස්ලිම් රටවල් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලද බව ද, විශේෂයෙන්ම පාකිස්ථානය ලංකාවට ඉතාමත් සමීපව කටයුතු කරන බව ද, කෙතරම් ප්‍රශ්න පැමිණිය ද, ඕමානයෙන් ශ්‍රී ලංකාවට ඛණිජ තෙල් සපයන බව ද සඳහන් කළේය.

මේ මස 24 වන දින ඉරුදින පුවත්පතේ කුරගල සම්බන්ධව පළවී තිබූ බව ද, එහි වැරදි අදහස් පළ කර තිබූ බව ද, තමන් කුරගල ජෙයිලානි මුස්ලිම් පල්ලියේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයකු  වශයෙන් ඒ සම්බන්ධව කණගාටුවට පත් වන බව ද සඳහන් කළේය. එහි සිටින මුස්ලිම් ජනතාව මඩකලපුවේ සිට ගෙන්වා පදිංචි කර ඇති බව එහි සඳහන් කර තිබූ බව ද, එම ස්ථානයේ මඩකලපුවේ සිට පැමිණි අය කී දෙනෙකු සිටී දැයි එහි ගොස් පරීක්ෂා කළේ නම් දැන ගැනීමට හැකිවනු ඇති බව ද සඳහන් කළේය. එමෙන්ම පුරාවිද්‍යා ස්ථානයන්හි අලුත්වැඩියා කටයුතු කළ බව එහි දැක්වී තිබුණ ද, එම ස්ථානයේ කසළ දැමීමට වලක් හෑරීමක් තරම් කාර්යයක් හෝ සිදු කර නොමැති බව ද සඳහන් කළේය. එමෙන්ම, එම ස්ථානයේ ගවයින් විශාල පිරිසක් ඝාතනය කර එම පූජාභූමිය අපවිත්‍ර කළ බව සඳහන් වුව ද, මෙවර උත්සවයේ දී ඝාතනය කරන ලද්දේ ගවයින් දෙදෙනෙකු පමණක් බව ද, එම ඝාතනයන් ද සිදු කරන ලද්දේ වෙනත් ස්ථානයක බව ද සඳහන් කළේය. පුවත්පතක මෙතරම් බොරු පළකිරීම පිළිබඳ විමතියට පත් වන බව ද සඳහන් කළේය.

කුරගල මුස්ලිම් පුදබිම බළන්ගොඩ ජනතාවට, ශ්‍රී ලාංකීය ජනතාවට පමණක් වැදගත් ස්ථානයක් නොවන බව ද, ඉරානය, පකිස්ථානය, ඉන්දියාව මෙන්ම සෞදි අරාබියෙන් පවා වන්දනාකරුවන් එහි පැමිණෙන බව ද සඳහන් කළේය. මෙවර පැවැත්වූයේ 124 වන උත්සවය බව ද, ඉතාමත් දීර්ඝ ඉතිහාසයක් මෙම ස්ථානයට ඇති බවට එය සාධකයක් බව ද එතුමන් වැඩි දුරටත් සඳහන් කළේය. මේක බෞද්ධයන්ට අයිති ස්ථානයක් නම් ඒ සම්බන්ධව ද ප්‍රශ්නයක් නොමැති බව ද, මුස්ලිම් වරුන්ට ඇති එකම ස්ථානය බැවින් එය මුස්ලිම්වරුන්ට ලබා දීමට හැකි නම් ඉතා සුදුසු බව ද, මුස්ලිම්වරුන් කිසිදු දිනෙක සිංහල ජනතාවට විරුද්ධව කටයුතු කර නොමැති බව ද, සියළු චෝදනා බොරු බව ද, වැඩි දුරටත් සඳහන් කළේය.

එමෙන්ම 2013 අප්‍රේල් මස 30 වන දින කුරගලට පැමිණ වෙන් කර ගන්නා බවට ප්‍රකාශයක් සිදු කර ඇති බවත් එවන් සිදුවීමක් කිසිදු දිනෙක නොවේවා යනු තමන්ගේ ප්‍රාර්ථනාව බව ද සඳහන් කළේය. ක්ලිෆර්ඩ් රත්වත්තේ, අබුසාලි, මොහාන් සාලිය එල්ලාවල වැනි මැති ඇමතිතුමන්ලා බළන්ගොඩ සිටි කාලයේ සිටම මුස්ලිම්, දෙමළ හා සිංහල ජනතාව මෙහි ඉතාමත් සාමයෙන් සමගියෙන් කටයුතු කර ඇති බව ද සිහිපත් කළේය. අබුසාලි මහතා බළන්ගොඩ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට ගියේ ද මේ සමගිය පැවතීම හේතුවෙන් බව සඳහන් කළේය.

මේ සම්බන්ධව ඉතාමත් විශාල වගකීමක් පළාත් සභා ගරු අමාත්‍ය භානු මුණිප්‍රිය මැතිතුමන්ට ද, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ට ද, ඇති බව ද, මුස්ලිම් ජනතාවගේ ගෞරවයට ලක්ව සිටින බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන් ද මේ සම්බන්ධව මැදිහත් වී කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වන බව ද සඳහන් කළේය.

***ගරු සභාපති ඩබ්. එම්. එන්. ජේ. වීරසිංහ මැතිතුමා***

*මේ සම්බන්ධව අදහස් දක්වමින්* ***ගරු සභාපතිතුමන්*** *ප්‍රකාශ කළේ, අප්‍රේල් 30 වන දින මුස්ලිම් ජනතාවට විරුද්ධව යමක් සිදු නොවනු ඇති බවට ද, පෞරාණික පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථානයක් බැවින් එහි ආරක්ෂාවට ජනතාව කටයුතු කරනවා පමණක් බව ද සඳහන් කළේය. මෙය පුරාවිද්‍යා ස්ථානයක් බවට නඩු තීන්දුවක් ද ඇති බව ද, සිංහල ජනතාව කිසි දිනෙකවත් ජාති භේදයක් ඇති වීමට කටයුතු නොකරන බව ද සඳහන් කළේය. බොහෝ මුස්ලිම් පිරිස් ද මෙවන් ස්ථානයක් තමන්ට අයත් නොවන බව සඳහන් කරන බව ද, මුස්ලිම් ජනතාව වෙළඳාමට පැමිණි බැවින් ඔවුන් වාසය කළේ නගරාශ්‍රිතව නිසා ඒ සම්බන්දව පැහැදිලි බව ද සඳහන් කළේය.*

***ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් ප්‍රකාශ කළේ, තමන් දිනපතා සිංහල පුවත්පත් කියවන බව ද, පෝය දිනයේ හා වෙනත් දිනවල බෞද්ධ ස්වාමීන් වහන්සේලාගේ ධර්ම දේශනාවන්ට ද රූපවාහිනිය ඔස්සේ සවන් දෙන බව ද, තමන් අදහන එකම ආගම නිවැරදිව පිළිපැදීමට අනෙකුත් ආගම් පිළිබඳව ද දැන සිටිය යුතු බවට ද සඳහන් කළේය.*

*සමස්ත ලංකා බෞද්ධ සංඝ සභාව ඉතාමත් හොඳ ප්‍රකාශයක් සිදු කළ බව ද, එයින් කියවුනේ ලංකාවේ සියළු ජනකොටස් වල ජීවත් වීමට අයිතියක් ලබා දී ඇති බව ද සඳහන් කළේය. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලබා ගැනීමේ දී මුස්ලිම් නායකයන් කැපවී කටයුතු කළ බව වැඩි දුරටත් සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව සමඟ ජීවත් විය නොහැකි නම් ලෝකයේ වෙනත් කිසිම බෞද්ධ ජනතාවක් සමඟ ජීවත් වීමට නොහැකි බව ද, ලංකාවේ එතරම් උතුම් සාමයෙන් හා සමගියෙන් යුතු ජනතාවක් ජීවත් වන බව ද සඳහන් කළේය. නමුත් ලක්ෂයකට 100-200 පමණ ඉතා සුළු පිරිසක් අන්තවාදීව කටයුතු කරන බව සඳහන් කළේය.*

*පසුගිය යුධ වකවානුවේ දී ද මුස්ලිම් ජනතාව රජය සමඟ සිටි බව ද, යාපනය දෙමළ ජනතාවගේ නිජ භූමිය නොවන බව ද, මුස්ලිම් ජනතාවගේ 60%ක නිජභූමිය*

*වූයේ යාපනය බව ද, ඔවුන් රජයට පක්ෂව හමුදාව සමඟ සිටි බැවින් ඇඳ සිටි ඇඳුම් සමඟ පහර දී පලවා හැරීමට කටයුතු කළ බව ද සඳහන් කළේය. තමන්ගේ නිජ භූමිය අත්හැර ගිය දා සිට වසර 30ක් පමණ බොහෝ ගණනක් මුස්ලිම් ජනතාව රට වෙනුවෙන් ජීවිත පූජා කර ඇති බව ද, එදා ඔවුන් කොටි ත්‍රස්තවාදීන් සමඟ එක්ව ඊලමක් අවශ්‍ය යැයි කීවා නම් ඔවුන්ට එහි සතුටින් සිටීමට හැකියාව තිබුණා. කාතන්කුඩි පල්ලිය, සම්මන්තුරේ, අක්කරෙපත්තු යනාදී ප්‍රදේශ වල මුස්ලිම් ජනතාව ඝාතනය කළේ ඔවුන් කිසිදු දිනෙක මේ රට තුළ වෙනම අඟලක්වත් ඉල්ලා නොසිටි නිසයි. සැම විටම රටේ නිදහස වෙනුවෙන් ඔවුන් කටයුතු කර තිබෙනවා.*

*ඇතැම් වීඩියෝ වල ඉතාමත් බරපතල අන්දමින් ජනතාව කෙටවීම සඳහා කරුණු ඇතුලත් වන බව ද, තමන්ට ද එවන් වීඩියෝවක් සිංහල ජාතික පුද්ගලයකු විසින් ගෙනැවිත් දුන් බව ද සඳහන් කළේය. එම වීඩියෝ පටය දකින එකට සිටින මිතුරකු වුව වෛර කිරීමට පෙළඹෙන බව ද ප්‍රකාශ කළේය.*

*වර්තමානයේ ශ්‍රී ලංකාවට බොහෝ මුස්ලිම් රටවල් වලින් කෝටි ගණනින් මුදල් ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන බව ද, මුස්ලිම් ජනතාව ජීවත් වන ප්‍රදේශ වලටත් වඩා බහුතර සිංහල ජනතාව ජීවත් වන ප්‍රදේශ වලට එම ආධාර ලබා දෙන බව ද සඳහන් කළේය.*

*අතිගරු ජනාධිපතිතුමන් මුස්ලිම් රටවල් සමඟ ඉතා සමීපව කටයුතු කරනවා. 90% බෞද්ධ ජනතාව මුස්ලිම් ජනතාව සමඟ ආදරයෙන් සමගියෙන් සිටිනවා. පසුගිය 123 ශ්‍රී ලංකාවේ මුස්ලිම් පළාත් පාලන නියෝජිතයන් ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තෆා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැඳවා රැස්වීමක් පැවැත්වූ බව ද, එහි දී බංගලාදේශයේ බෞද්ධ සිද්ධස්ථාන විනාශ කිරීම ගැන ද කතා කළ බව ද, මුස්ලිම් ජනතාවට ද එයට විරුද්ධ බව ද සඳහන් කළේය. නමුත් දඹුල්ල වැනි ස්ථාන වල මුස්ලිම් දේවස්ථාන කැඩීමේ දී කිසිවකුත් කතා නොකළ බව ද සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ ජාතිවාදය, ත්‍රස්තවාදය ඇති කර සමගිය නැති කිරීමෙන් මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමන් පරාජය කිරීමට යම් සැලැස්මක් ඇති බව ද, සඳහන් කළේය.*

*හදවතේ ඇති දේ දන්නේ තමන් සහ දෙවියන් පමණක් බව ද, සියළුම දේ දෙවියන්ට භාර දී ඇති බව ද, උපදින දිනය සහ මිය යන දිනය දන්නේ ද දෙවියන් බව ද, තමන් නිතරම දෙවියන් හමුවේ ප්‍රාර්ථනා කරන්නේ වෛරයෙන් ක්‍රෝධයෙන් බලන අයට හොඳ චේතනාවක් ලබා දෙන මෙන් බව ද සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළට ඇතුළු වන විට ආයුබෝවන් යනුවෙන් කියා පිළිගන්නා බව ද වෙනත් රටවල එම පිළිගැනීමේ සිරිතක් දක්නට නොමැති බව ද, ඉන්දියාවෙන් බෞද්ධ ස්වාමීන් වහන්සේ නමකට තර්ජනය කිරීම හෙළා දකින බව ද සඳහන් කළේය.*

*නෝලිමිට් ආයතනයෙන් දෙන ටොෆියක් කෑ විට දරුවන් ලැබීම නතර වන බවට පසුගිය කාලයේ ප්‍රචාරයක් සිදු වූ බව ද, එම ටොෆිය නිෂ්පාදනය කරන ලද්දේ උස්වත්ත කොන්ෆැක්ෂනරීස් ආයතනය බව ද, එය ප්‍රවීන ගායක සුනිල් පෙරේරා මහතාට අයත් ආයතනයක් බව ද, එවන් විෂ ද්‍රව්‍යයක් ඇති නම් කළ යුතුව තිබුණේ එවන් ටොෆියක් රැගෙන ගොස් පරීක්ෂාවට ලක් කර ඔවුන් අත්අඩංගුවට ගැනීම බව ද සඳහන් කළේය. එමෙන්ම චීප් සයිඩ් ආයතනයේ අලෙවි කරන කාන්තා යට ඇඳුම් වල ද දරුවන් ලැබීම වලක්වන රසායනික ද්‍රව්‍ය ඇති බවට ප්‍රචාරයක් සිදු වූ බව ද සඳහන් කළේය.*

*මේ රට අපගේ මවුබිම වන අතර, වෙනත් කිසිදු රටක් ගැන සිතීමටවත් කිසිදු අවශ්‍යතාවයක් නොමැති බව ද, මේ ආකාරයට ජාතිවාදය ඇවිස්සීම නුසුදුසු බව ද, වෙනත් රටවල ද මේ දිනවල එසේ සිදුවන බව ද සඳහන් කළේය. බුදු රජාණන් වහන්සේ ද මොහොමඩ් නබිතුමන් ද ජීවත් වීමට ඉතාමත් හොඳ මාර්ගයක් දේශනා*

*කර ඇති බව ද, බෞද්ධ රටතුළ ඇති කළ යුත්තේ අරක්කු පානයෙන් වැලැක්වීම බව ද, උදේට අරක්කු බී සවසට පංසල් යාමෙන් ඵලක් නොවන බව ද සඳහන් කළේය. මුස්ලිම් ජනතාව මෙම රටෙන් අඟලක් හෝ විදේශිකයන්ට අයත් වනවාට අකැමති බව ද එබැවින් සියළු දෙනාම සමගියෙන් ජීවත් වීමට ප්‍රාර්ථනා කරන බව ද සඳහන් කළේය.*

## 17. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

සිංහල, දෙමළ හා මුස්ලිම් සියළු ජනතාවටම අලුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් සභාවේ වැඩ කටයුතු ප. ව. 1.00ට පමණ අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.